

# 11 වසර චිත්‍ර කලාව

කේ.ඩබ්.චන්දන කුමාරසිංහ,
කෑ/වර/ධර්මසිරි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය,
තුල්හිරිය.

නිපුනතාවය:3.0

“ පාරිභාරික” අවශ්‍යතා සඳහා නිර්මාණකරණයේ යෙදෙයි.

නිපුනතා මට්ටම;- “ නිර්මාණාත්මක” සැරසිළි ඒකක භාවිතා කර භාණ්ඩ සඳහා සැරසිළි නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම;

“නිර්මාණාත්මක” හැඩතලා යොදා දොර රෙදි සඳහා සැරසිල්ලක්

මෝස්තර ඒකකයක් නිර්මාණය කිරීමේදී අවස්ථා 4ක් දැක්විය හැකිය.

එනම්,

1.ස්වාභාවික හැඩය ඒ අයුරින්ම යොදා ගෙන මෝස්තර ඒකකය නිර්මානය කිරීම.

2.ස්වාභාවික හැඩයෙන් කොටසක්ඉවත් කර මෝස්තර ඒකකය නිර්මානය කිරීම.

3.ඉවත් කළ හැඩයට නව හැඩතලයක් එකතු කර මෝස්තර ඒකකය නිර්මාණය කිරීම.

4.මූලික හැඩය තබා ගනිමින් එය නිර්මාණාත්මකව වෙනස් කර මෝස්තර ඒකකය නිර්මාණය කිරීම.




- සිරස් අතට විහිදී යන ලෙස ශාක හා සත්ව රූප මූලික කරගෙන නිර්මාණාත්මකව සිතුවම් කළ දොර රෙදි මෝස්තරයක්.



- මලක් සහ කොළයක් මෝස්තර ඒකකයක් ලෙස ගෙන සිතුවම් කළ දොර රෙදි මෝස්තරයක්.

- සංගත වර්ණ සහ විසංගත වර්ණ භාවිතා කරමින් නිර්මාණය කළ දොර රෙදි මෝස්තරයක්.

➢ චතුසුද්ද මලක් ඇසුරින් ඒහි මූලික හැඩය තබා ගනිමින්,හැඩ ඒකතු කරමින් අවශ්‍යය මෝස්තර ඒකකය නිර්මාණය කිරීම.






- තල් කොළයක් ආශ්‍රයෙන් සරළ මෝස්තර ඒකකයක් නිර්මාණය කිරීම





# දළ සටහන් ඇඳීම





- මෝස්තර ඒකක කිහිපයක් භාවිත කරමින් අවශ්‍ය මෝස්තරය “ජෙල්” පෑනකින් ඇඳ ගැනීම.
- පිටපත් කර ගැනීම සඳහා ට්‍රේසින් කඩදාසි භාවිතා කිරීම.



- නිවැරදි ආකාරයෙන් පිටපත් කරන ලද දොර රෙද්ද වර්ණ ගැන්වීම.

- මෙහිදී කොළ සහ කහ වර්ණත්,ඒවායේ ප්‍රභේදත් භාවිතා කරමින් වර්ණ ගන්වා ඇත.ඇක්‍රිලික්,දියසායම් යන වර්ණ භාවිතා කර ඇත.



- වර්ණ ශක්තීන් භාවිතා කරමින් වර්ණ සමබරතාවයකින් යුතුව වර්ණ ගන්වා ඇත.



- සැම මෝස්තර ඒකකයක්ම ඒකම ආකාරයෙන් යුතුව වරණ ගැන්විය යුතුය.නැතහොත් වර්ණ සමබරතාවය බිදි යනු ඇත.



- දොර රෙදි නිර්මාණයන් සදහා අදුරු වර්ණ වැඩි වශයෙන් යොදා නොගනී.දීප්තිමත් වර්ණ සහ සංගත වර්ණ මාලාවන් භාවිතා කිරීම තුළ ඉතා අලංකාර මෝස්තර නිර්මාණය කළ හැක.



- චිත්‍රය අවසානය දක්වා තමාගේ අවධානය පවත්වා ගැනීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

පැවරුම:-

ස්වාභාවික ශාකමය හැඩ හෝ සත්ව රූප හෝ ජ්‍යාමිතික හැඩ නිර්මාණාත්මකව භාවිතා කරමින් “දොර රෙද්දකට” සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.

ස්තූතියි!

කේ.ඩබ්.චන්දන කුමාරසිංහ,

කෑ/වර/ධර්මසිරි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය

තුල්හිරිය.